(5)

00224

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ උසස් සහතික පත්‍ර වැඩ සටහන

අවසාන පරීක්ෂණය - 2018

**EPA2815/ESC2315- මූල් ළමාවියෙහි සංවර්ධනය**

කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2018.12.28 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ තෝරා ගනු ලබන ප්‍රශ්න තුනකට ද (03) පිළිතුරු සපයන්න.

**1 වන කොටස**

01. කායික සංවර්ධනයේ එක් මූලධර්මයක් වන "කඳ සිට දෑත් දක්වා වන වර්ධනය" පැහැදිලි කරන්න.

02. "ඉගෙනීම" යනු කුමක් ද?

03. (i) "පූර්ව ප්‍රසව වර්ධනය" කෙරෙහි බලපාන සාධක තුනක් (03) නම් කරන්න.

 (ii) ඉන් එක් සාධකයක් පූර්ව ප්‍රසව වර්ධනයට යහපත් ලෙස බලපාන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

04. "තදාත්මීකරණය" යන සංකල්පය උදාහරණයක් මගින් පැහැදිලි කරන්න.

05. කුඩා ළමයින්ගේ ක්‍රියාකාරකම් කෙරෙහි "පරිනතිය" බලපාන ආකාරය උදාහරණයක් මගින් පැහැදිලි කරන්න.

06. පෙර පාසල් අවධියේ දී ළමයින් පෙන්නුම් කරන "සමාජීය චර්යා රටාවන්" හතරක් (04) නම් කරන්න.

07. (i) පෙර පාසල් ළමයින්ගේ ඉගෙනුම් උපාය මාර්ග හතරක් (04) නම් කරන්න.

 (ii) ඉන් එක් "උපායමාර්ගයක් "(01) පැහැදිලි කරන්න.

08. පෙරපාසල් අවධියේ ළමයින්ගේ "භාෂා සංවර්ධනය" කෙරෙහි බලපාන සාධක පහක් **(05)** නම් කරන්න. ( ලකුණු 8 x 5 = 40)

## 2 වන කොටස

09. (i) පූර්ව ප්‍රසව සංවර්ධනයේ අවධි තුන **(03)** නම් කරන්න. (ලකුණු 03)

(ii) ළමයින් තුළින් නිරීක්ෂණය කළහැකි ජානමය (ආරමය) බලපෑම් තුනක් **(03)** නම් කර පැහැදිලි කරන්න. (ලකුණු 09)

(iii) "පූර්ව ප්‍රසව සංවර්ධනය ළමයෙකුගේ පසු අවධියේ සංවර්ධනයට පදනම සපයයි." තර්කානුකූලව කරුණු ඉදිරිපත් කරමින් මෙම කියමන විභාග කරන්න. (ලකුණු 08)

10. (i) "පූර්ණ පෞරුෂ සංවර්ධනය" යන සංකල්පය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) ළමයින් තුළ යහපත් කායික සංවර්ධනයක් ඇති කිරීම සඳහා පෙර පාසල් ගුරුවරියට මැදිහත් විය හැකි ආකාරය උදාහරණ මගින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

11. "ළමයි කිසිවිටෙකත් තවකෙකු හා සමාන නොවෙති."

(i) සමාන වයසේ ළමයින්ගේ ශරීර ප්‍රමාණයේ විවිධතා ඇතිවීමට බලපාන සාධක පහක් **(05)** නම් කරන්න. (ලකුණු 05)

(ii) මනෝචාලක හැකියාවන්ගේ ප්‍රභේද දෙක **(02)** නම් කරන්න. (ලකුණු 01)

(iii) ළමයින්ගේ මනෝචාලක කුසලතා කෙරෙහි බලපාන සාධක දෙකක් **(02)** පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iv) ළමයින් තුළ "මනෝචාලක කුසලතා" සංවර්ධනය කිරීම සඳහා පෙර පාසල් ගුරුවරියක විසින් සංවිධානය කළ හැකි ක්‍රියාකාරකම් හතරක් **(04)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

12. (i) පෙරපාසල් අවධියේ ළමයින් පෙන්නුම් කරන අයහපත් (සමාජයීය නොවන) චර්යා රටාවෙන් පහක් **(05)** නම් කරන්න. (ලකුණු 05)

(ii) ඉහත චර්යා රටා සහිත ළමයින් නිසා ගුරුවරුන්ට හා පෙර පාසලේ අනෙකුත් සිසුන්ට මුහුණ දීමට සිදුවන ගැටලු සහගත තත්ත්වයන් උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 07)

(iii) පෙරපාසල් ළමයින්ගේ අයහපත් සමාජීය (සමාජයීය නොවන) චර්යා රටා අවම කිරීමට පෙර පාසල් ගුරුවරිය කටයුතු කළයුතු ආකාරය සුදුසු උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

13. (i) පාසල් ළමයින්ගෙන් ප්‍රකට වන සුවිශේෂී චිත්තවේග හතරක් **(04)** නම් කරන්න. (ලකුණු 04)

(ii) පෙර පාසල් අවධියේ ළමයින්ගේ චිත්තවේගවල දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණ තුනක් **(03)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 09)

(iii) ළමයින් තුළ යහපත් චිත්තවේග වර්ධනය කරන මාර්ගෝපදේශකයෙකු වශයෙන් පෙර පාසල් ගුරුවරියගේ භූමිකාව පැහැදිලි කරන්න. (ලකුණු 07)

හිමිකම් ඇවිරිණි.